# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1715/12 - 2011 ජූලි මස 20 වැනි බදාදා - 2011.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.–බී. 8/2007.

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත**

2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 36 වැනි සහ 38 වැනි වගන්ති සමග කියවිය යුතු, එම පනතේ 67 වැනි වගන්තිය යටතේ, විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

පාඨලී චම්පික රණවක,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2011 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් පිළිබඳ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

**බලශක්ති කළමනාකරුවන්**

2. (අ) උසස් අධ්‍යාපන ආයතනයක ඉංජිනේරු විද්‍යාව, විද්‍යාව, ගිණුම්කරණය, ව්‍යාපාර කළමනාකරණය හෝ වාණිජ්‍යය උපාධිධාරියෙකු වන සහ අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ වසර එකක සේවා පළපුරුද්ද ඇති තැනැත්තෙකු ;

හෝ

(ආ) කිසියම් පිළිගත් අධ්‍යාපන ආයතනයක ඉංජිනේරු විද්‍යාව, විද්‍යාව, ගිණුම්කරණය, ව්‍යාපාර කළමනාකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු සහ අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ වසර දෙකක සේවා පළපුරුද්ද ඇති තැනැත්තෙකු,

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 38 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ (මෙම නියෝගවල මින්මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ බලශක්ති කළමනාකරුවකු ලෙස පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

3. බලශක්ති කළමනාකරුවකු ලෙස පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන සෑම තැනැත්තකු විසින්ම, එම තැනැත්තා කැමති නම්, බලශක්ති කළමනාකරුවකු ලෙස පත් කරනු ලැබීම සඳහා සහ බලශක්ති කළමනාකරුවෙකු ලෙස ප්‍රතීතන සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා මේ පනතේ 3 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ආකාරයට තත් කාර්ය සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

4. 3 වැනි නියෝගය ප්‍රකාර නිකුත් කරනු ලැබූ සෑම ප්‍රතීතන සහතිකයක්ම, මෙම නියෝගවල "අ" උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙහි විය යුතු ය.

**බලශක්ති විගණකවරුන්**

5. (අ) උසස් අධ්‍යාපන ආයතනයක ඉංජිනේරු උපාධිධාරියෙකු (විද්‍යාවේදී ඉංජිනේරු) හෝ මණ්ඩලය විසින් පිළිගනු ලබන ඊට සමාන වෙනත් සුදුසුකමක් ඇති බලශක්ති කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර දහයක සේවා පළපුරුද්දක් තිබෙන;

හෝ

(ආ) බලශක්ති කළමනාකරණය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහිත ඉංජිනේරු විද්‍යාව හෝ විද්‍යාව පිළිබඳව උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් උපාධියක් ඇති බලශක්ති කළමනාකරණ ක්ෂේත්‍රයේ අවුරුදු හතක සේවා පළපුරුද්දක් තිබෙන,

සහ අධිකාරිය විසින් පිළිගත් ආයතනයකින් පවත්වනු ලබන පරිපූර්ණ බලශක්ති විගණන පුහුණු වැඩසටහනකට සහභාගි වී ඇති සහ අධිකාරිය විසින් පිළිගත් මට්ටමක වන බලශක්ති විගණන දහයකට නොඅඩු ගණනක නියැලී ඇති, යම් තැනැත්තෙකු 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 38 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බලශක්ති විගණකවරයෙකු ලෙස පත්කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

6. බලශක්ති විගණකවරයකු ලෙස පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන සෑම තැනැත්තකු විසින්ම, එම තැනැත්තා කැමති නම්, බලශක්ති විගණකවරයකු ලෙස පත් කරනු ලැබීම සඳහා සහ බලශක්ති විගණකවරයකු ලෙස ප්‍රතීතන සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා මේ පනතේ 3 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ආකාරයට තත් කාර්ය සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

7. 6 වැනි නියෝගය ප්‍රකාර නිකුත් කරනු ලැබූ සෑම ප්‍රතීතන සහතිකයක්ම, මෙම නියෝගවල "ආ" උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙහි විය යුතු ය.

**සාමාන්‍ය**

8. මේ පනතේ 3 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ කළමනාකරණ මණ්ඩලය විසින්, අවස්ථාවෝචිත පරිදි, බලශක්ති කළමනාකරුවන් හෝ බලශක්ති විගණකවරුන් වශයෙන් ප්‍රතීතන සහතිකපත්‍ර නිකුත් කරනු ලැබ ඇත්තා වූ බලශක්ති කළමනාකරුවන් හෝ බලශක්ති විගණකවරුන් වශයෙන් පත්කර ඇති සියලු තැනැත්තන්ගේ නම් ඇතුළත් කර ඇත්තා වූ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකෘතියෙහි වූ රෙජිස්ටරයක් පවත්වාගෙන යෑම හෝ පවත්වාගෙන යෑමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය යුතු ය.

9. ප්‍රතීතන සහතික පත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව, සෑම බලශක්ති කළමනාකරුවකුම සහ බලශක්ති විගණකවරයෙකුම අධිකාරිය විසින් කාලීනව පවත්වනු ලබන විභාග සඳහා පෙනී සිටිය යුතු අතර, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකෘතියෙන් වූ කාර්ය සාධන සමාලෝචන වාර්තාවක් සෑම වර්ෂ තුනකට වරක්ම අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. ප්‍රතීතන සහතික පත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව, සෑම බලශක්ති කළමනාකරුවකු සහ බලශක්ති විගණකවරයකු විසින්ම අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට බලශක්ති කළමනාකරණය හෝ වෙනත් යම් ආශ්‍රිත වැඩසටහන් පිළිබඳ පරිපූර්ණ පුහුණුවක් යටතේ පිරිසෙයින් වර්ෂ තුනකට වරක්වත් හැදෑරීම ඇතුලුව අධිකාරිය විසින් පිළිගනු ලබන මට්ටමක වෘත්තීය සංවර්ධනය පිළිබඳ නිතිපතා පුහුණුවක් ලබා ගැනීමට නියම කරනු ලැබිය යුතු ය.

11. මෙම නියෝගවල –

"අධිකාරිය" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් ඊට දී ඇති සමාන අදහසම ඇත්තේ ය.

"අ" උපලේඛනය

(4 වැනි නියෝගය)

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

ප්‍රතීතන සහතිකය (බලශක්ති කළමනාකරු)

සහතිකපත් අංකය : ......................................................

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 38(1) වගන්තිය යටතේ සාදන ලද 2011 බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් පිළිබඳ නියෝගවල 2 වැනි නියෝගයේ නියම කොට ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද

..............................................................................................................

වෙත මෙම සහතිකය නිකුත් කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය.

දිනය :

(මෙම සහතිකය එහි පසුපිට මුද්‍රණය කොට ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.)

**අදාළ නියම සහ කොන්දේසි**

ප්‍රතීතන බලශක්ති කළමනාකරු එම බලශක්ති කළමනාකරු සේවයේ නියුක්ත කරනු ලබන පාරිභෝගිකයකු විසින් බලශක්තිය සැකසුරුවම් ලෙස භාවිතා කිරීම පිණිස මග පෙන්වීම සහ උනන්දු කරවීම සම්බන්ධයෙන් වගකීම දරනු ලබන අතර, ඊට විශේෂයෙන්ම පහත සඳහන් කටයුතු ද ඇතුළත් වේ:-

(අ) බලශක්ති පිරිවැය අඩුකිරීමේ අරමුණින් පාරිභෝගිකයාගේ එදිනෙදා මෙහෙයවීම් කටයුතු සමීක්ෂණය කිරීම සහ එම පාරිභෝගිකයාගේ සමස්ත බලශක්ති පරිභෝජනය හා අදාළ වාර්තා පවත්වාගෙන යාම ;

(ආ) පාරිභෝගිකයාගේ සියලුම මෙහෙයුම් මට්ටම්වල සේවකයන් සඳහා බලශක්ති කාර්යක්ෂමතාවය හා අදාළ පුහුණුවීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ;

(ඇ) පාරිභෝගිකයා සතුව පවත්නා බලශක්ති සංරක්ෂණ අවස්ථා හඳුනාගැනීම සඳහා කලින් කල, ප්‍රතීත බලශක්ති විගණකවරයෙකුගේ සේවාව ලබා ගැනීම ;

(ඈ) බලශක්ති කාර්යක්ෂමතා උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් පාරිභෝගිකයාට උපදෙස් දීම ;

(ඉ) පාරිභෝගිකයා විසින් ඉදිකරනු ලබන නව ඉදිකිරීම්, බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි සඳහා වන චර්යාධර්ම සංග්‍රහය හා අනුකූල වන බවට වග බලා ගැනීම ;

(ඊ) පාරිභෝගිකයාගේ බලශක්ති පරිභෝජනය පිළිබඳ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම ;

(උ) සෑම වසර දෙකකට වරක්ම, පාරිභෝගිකයාගේ බලශක්ති කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම ;

(ඌ) පාරිභෝගිකයාට සිය වාර්ෂික බලශක්ති කළමනාකරණ සැලැස්ම නියමිත කාල රාමු තුළ දී, ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම ;

(එ) නව බලශක්ති කළමනාකරණ තාක්ෂණයන්හි වැඩිදියුණු කිරීම පිළිබඳව දැනුවත්ව සිටීම ;

(ඒ) මාසික හා ත්‍රෛමාසික බලශක්ති පාරිභෝජන වාර්තා, පාරිභෝගිකයාගේ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කිරීම ;

(ඔ) අධිකාරිය සහ පාරිභෝගිකයා අතර බලශක්ති කළමනාකරණයට අදාළ සියලු සන්නිවේදනයන් ; සහ

(ඕ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36(2) (ආ) වගන්තිය යටතේ නියම කරන ලද ආකෘතියෙන් තමා වැඩකරනු ලබන්නේ යම් පාරිභෝගිකයකු සම්බන්ධයෙන් ද එම පාරිභෝගිකයා පිළිබඳව වාර්ෂිකව බලශක්ති පරිභෝජන වාර්තා සැපයීම.

"ආ" උපලේඛනය

(7 වැනි නියෝගය)

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

ප්‍රතීතන සහතිකය (බලශක්ති විගණක)

සහතිකපත් අංකය : ........................................................

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 38(1) වගන්තිය යටතේ සාදන ලද 2011 බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් පිළිබඳ නියෝගවල 5 වැනි නියෝගයේ නියම කොට ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද

........................................................................................................................

වෙත මෙම සහතිකය නිකුත් කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය.

දිනය :

08-93

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.